**ශීර්ෂ 247 - ශ්‍රී ලංකා රේගුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා රේගුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2015 නොවැම්බර් 20 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

ශ්‍රී ලංකා රේගුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,079 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,014 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 65 ක් හෙවත් සියයට 3 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,680.69 | 1,659.49 | 21.20 | 1.26 |
| මූලධන | 398.11 | 354.14 | 43.97 | 11.05 |
| **එකතුව** | **2,078.80** | **2,013.63** | **65.17** | **3.13** |

**2.2 ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

ශ්‍රී ලංකා රේගුව 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 12 ක් සඳහා එකතුව රු.මිලියන 453,120 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 398,617 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 88 ක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන්දීමේ නිලධාරි | ආදායම් සංකේතය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | තථ්‍ය ආදායම | (අඩුවෙන් එකතුකිරීම)/ වැඩියෙන් එකතුකිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 10.01.01.00 | 85,000.00 | 77,726.31 | (7,273.69) | 91 |
| - එම - | 10.01.02.00 | 25.00 | 24.08 | (0.92) | 96 |
| - එම - | 10.01.04.00 | 80,000.00 | 68,646.23 | (11,353.77) | 86 |
| - එම- | 10.01.05.01 | 40,000.00 | 35,622.38 | (4,377.62) | 89 |
| - එම- | 10.01.05.02 | 5,000.00 | 3,084.68 | (1,915.32) | 62 |
| - එම- | 10.01.08.00 | 65,000.00 | 47,952.91 | (17,047.09) | 74 |
| - එම- | 10.02.05.01 | 61,000.00 | 57,204.26 | (3,795.74) | 94 |
| - එම- | 10.02.05.02 | 0 .00 | 12.12 | 12.12 | |
| - එම- | 10.02.05.03 | 40,000.00 | 28,732.33 | (11,267.67) | 72 |
| - එම- | 10.02.05.04 | 70,000.00 | 76,435.13 | 6,435.13 | 109 |
| - එම- | 10.02.05.99 | 7,000.00 | 3,087.14 | (3,912.86) | 44 |
| - එම - | 20.03.02.17 | 95.00 | 89.28 | (5.72) | 94 |
| **එකතුව** | | **453,120.00** | **398,616.85** | **(54,503.15)** | 12 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා රේගුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 24701 | 46.00 | 25.47 | 35.00 | 43.84 | 300.00 | 208.45 |

**2.3.2 වාණිජ නොවන අත්තිකාරම් ගිණුම**

ශ්‍රී ලංකා රේගුව විසින් වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා රේගුවට අදාල වාණිජ නොවන අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 24702 | 10.00 | 8.08 | 2.00 | 4.43 | 20.00 | 24.62 |

**2.4 අග්‍රිම ගිණුම**

ශ්‍රී ලංකා රේගුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 3.31ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම්**

ශ්‍රී ලංකා රේගුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 9,295.81 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පතුවේ නම** | **තැන්පත් ගිණුම් අංකය** | **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | රු.මිලියන |
| විවිධ තැන්පතු | 6000/0000/00/0015/0127/000 | 4,011.25 |
| රේගු නිලධාරින්ගේ කළමනාකරණ වන්දි අරමුදල | 6000/0000/00/0006/0061/000 | 4,167.98 |
| රේගු නිලධාරින්ගේ තෑගි අරමුදල | 6000/0000/00/0006/0062/000 | 1,116.58 |
| **එකතුව** | | **9,295.81** |

**2.6 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා රේගුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම්, වාණිජ නොවන අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 247 - ශ්‍රී ලංකා රේගුව**

**3.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා රේගුව විසින් 2015 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය අංකය/ ගිණුම් අංකය | ගිණුමේ නම | 2015 මාර්තු 31 දින වන විට ප්‍රමාදය |
|---|---|---|
| 24701 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය | මාස 01 |
| 6000/0000/00/0006/0033/000 | රේගු අතිකාල හා නැව්බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල | මාස 01 |
| 6000/0000/00/0006/0061/000 | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල | මාස 01 |
| 6000/0000/00/0006/0062/000 | රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල | මාස 03 |
| 7000/0000/00/0247/0002/000 | අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම | දින 28 |

## 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

--------------------------------------------

ශ්‍රී ලංකා රේගුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| පරිගණක උපාංග මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.3 විගණන සාක්ෂි නොවීම

--------------------------

මුදල් රෙගුලාසි 272(3) ප්‍රකාරව රු.108,483,557 ක් වටිනා ගෙවීම් වවුචර් 94 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.4 විසර්ජන ගිණුම

---------------

### 3.4.1 අයවැය විචලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 01 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසුව ඉතිරිය එම වැය විෂයයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 70 ක් වී තිබුණි.

(ආ) 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ඇස්තමේන්තු මගින් සලසා දී තිබුණු ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණය කරගත යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුව විසින් එම උපදෙස් නොසළකා කටයුතු කර තිබුණි. විස්තර පහත දැක්වේ.

(i) ඉන්ධන වැය විෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.40,000,000 ක් වූවද ඉන් රු.39,477,893 ක් උපයෝජනය කර තිබුණි. එම වියදමට අතිරේකව තවත් රු.3,993,341 ක් ත්‍යාග අරමුදල යටතේ වූ ඉන්ධන අරමුදලින් වැය කර ප්‍රතිපාදන ඉක්මවීම අනාවරණයවීම වළක්වා තිබුණි.

(ii) විදුලි හා ජලය වැය විෂයය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.140,000,000 ක් වූ අතර, ඉන් රු.139,999,063 ක් උපයෝජනය කර තිබුණි. එම වියදමට අතිරේකව කටුනායක රේගු විවේකාගාරයයට අදාල රු.273,603 ක් වූ විදුලි වියදම් කළමනාකරණ හා වන්දි අරමුදලින්ද වැය කර ප්‍රතිපාදනය ඉක්මවීම අනාවරණය වීම වළක්වා තිබුණි.

(iii) ගෘහභාණ්ඩ, කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම සඳහා රු.7,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් එකතුව රු.6,973,427 ක් උපයෝජනය කර තිබුණි. එම වියදමට අතිරේකව රු.12,164,593ක් කළමනාකරණ වන්දි අරමුදලෙන්ද වැය කර තිබුණි.

(iv) ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂයය සඳහා රු.46,500,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.46,408,561 ක් උපයෝජනය කර තිබුණි. එම වියදමට අතිරේකව රු.8,839,849 ක් කළමනාකරණ හා වන්දි අරමුදලෙන්ද වැය කර තිබුණි.

(ඇ) යථෝක්ත චක්‍රලේඛයේ 2.1.3 (i) ඡේදය ප්‍රකාරව විදුලි හා ජල බිල්පත් ලැබී මසක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබූ නිසා සමාලෝචිත වර්ෂයේ රු.3,403,540 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවා තිබුණි.

## 3.5 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් ආදායම් සංකේත12 ක් ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවැරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේත 12 ට අදාලව රු.මිලියන 453,120 ක ආදායම් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය

අවසානයට රු.මිලියන 398,617ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 88 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් එකතු කර තිබුණු රු. මිලියන 398,617 ක ආදායම ඉකුත් වර්ෂයට වඩා රු. මිලියන 35,831 ක වැඩිවීමකි. මෝටර්රථ නිෂ්පාදන බදු, අනෙකුත් නිෂ්පාදන බදු සහ වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු යනාදියේ වැඩිවීම සමස්ථ ආදායම වැඩිවීම සඳහා බලපා තිබුණ අතර ඉකුත් වර්ෂයට වඩා එම බදු ආදායම් පිළිවෙලින් සියයට 37.68, සියයට 22.69 සහ සියයට 11.61 කින් වර්ධනය වී තිබුණි. මෙලෙස වැඩිවී තිබූ ආදායමින් රු.මිලියන 20,918 ක් හෙවත් සියයට 58.38 ක්ම මෝටර්රථ නිෂ්පාදන බදුවලින් එකතුකළ ආදායම් විය.

(ඇ) 2014 වර්ෂයේ ආදායම් ව්‍යුහය තුළ ඉහළම දායකත්වය ආනයන බදු, මෝටර්රථ නිෂ්පාදන බදු, වරාය හා ගුවන්තොටුපල බදු, සිගරට් සඳහා වන නිෂ්පාදන බදු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු වලින් ලැබී තිබූ අතර, එය මුළු රාජ්‍ය ආදායමෙන් පිළිවෙලින් සියයට 19.5, සියයට 19.17, සියයට 17.23, සියයට 14.36 හා සියයට 12.03 ක් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සිගරට් නිෂ්පාදන බදු අදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබුණු අතර එම අඩුවීම රු.මිලියන 1,330 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා සියයට 2.27 ක ප්‍රමාණයක් වී තිබුණි.

(ඉ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම් අනුව එකතුව රු.16,027,833,120 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම 2002 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වන කාල පරාසයකට අදාල විය. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

(ඊ) 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ හිඟහිටි ආදායම රු.2,801,897,010 කින් හෙවත් සියයට 21.18 කින් වැඩිවී තිබුණි. හිඟහිටි ආදායමින් සියයට 99 ක් හෙවත් රු.මිලියන 15,879 ක් ආනයන බදු, ඛණිජ තෙල් නිෂ්පාදන බදු, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු, ආනයන සෙස් බදු සහ මෝටර් රථ නිෂ්පාදන බදු යන බදු වර්ග නියෝජනය විය.

(උ) 2014 දෙසැම්බර් 31 දිනට රු.4,107,052,583 ක් වූ ඛණිජතෙල් මත හිඟ නිෂ්පාදන බදු ප්‍රමාණයෙන් හා රු.809,372,564 ක දඩ මුදලින් 2015 ජුනි 30 දින වන විට අයවිය යුතු

බණිජතෙල් මත හිඟ නිෂ්පාදන බදු ප්‍රමාණය හා දඩ මුදල් ප්‍රමාණය පිළිවෙලින් රු.2,037,095,057 ක් හා රු.319,573,717 ක් වී තිබුණි.

(ඌ) සමාගම් 2 ක් විසින් ගෙවිය යුතු වූ එකතුව රු.200,023,755 ක හිඟ නිෂ්පාදන මත්පැන් බදු සහ දඩ 2002 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණත්, එම බදු හා දඩ අයකර ගැනිමට නීතිමය පියවර ගෙන තිබුණත්, 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනිමට අපොහොසත් වී තිබුණි

(එ) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව බදු අයකිරීම් කල් දැමීමේ පදනම මත රාජ්‍ය ආයතනවලට වාහන මුදා හැරීම නිසා හිඟ මෝටර් රථ නිෂ්පාදන බද්ද 2008 වර්ෂයේ සිට සමුච්චනයවී තිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂය රු.1,155,858,936 ක් වී තිබුණි.

(ඒ) හිඟහිටි නිෂ්පාදන බදු ආදායම් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2014 වර්ෂයේදී 2013 වර්ෂයට සාපේක්ෂව සියයට 75 කින්ද, 2011 වර්ෂයට සාපේක්ෂව සියයට 307 කින්ද වැඩි වී තිබුණි.

(ඔ) හිඟහිටි නිෂ්පාදන බදු අයකර ගැනීම සඳහා 1989 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා කාලය තුළ නඩු පවරන ලද ආයතනවලින් 2015 ඔක්තෝබර් 31 දින වන විට ආයතන 208 කින් රු.30,418,421 හිඟ නිෂ්පාදන බදු මුදලක් සහ රු.16,566,261 දඩ මුදල් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. එහි රු.10,000 ට අඩු හිඟ නිෂ්පාදන බදු අයවිය යුතු ආයතන සංඛ්‍යාව 76 ක් විය.

(ඕ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව 2014 වර්ෂය සඳහා ආදායම් සංකේතාංක 12 කට අදාල අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ක) ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලිය තුළ නිරීක්ෂණය වූ අඩුපාඩු රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර තිබුණු අතර ඒවා අතරින් කිහිපයක් පහත දැක්වේ.

(i) ආනයනික බහාළුම්වලට අදාලව සමාලෝචිත වර්ෂයේදී රේගු සටහන්කර 192,848 ක් ඉදිරිපත් කර තිබූ අතර එයින් සටහන්කර 22,728 ක් හෙවත් සියයට 11.78 ක් පමණක් විධිමත් පරීක්ෂණ ක්‍රියාවලියකට යොමු කර තිබුණි. සියයට

88.22 ක් ප්‍රමාණවත් පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ රේගු සටහන්කර 175,062 කින් 27,222 ක් හෙවත් සියයට 15.5 ක් විධිමත් පරීක්ෂාවන් කර නිදහස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ රේගු සටහන්කර ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා 17,786 කින් වැඩි වී තිබියදීත්, බහාළුම් විධිමත් පරීක්ෂාවකින් පසුව නිදහස් කළ ප්‍රමාණය 22,728 ක් හෙවත් සියයට 11.78 ක් වි තිබුණි. එම ක්‍රමවේදය යටතේ, රේගු පනතේ විධිවිධානවලට පටහැනි ආනයනයන්, නිදහස්වීමට හැකියාවක් පවතින බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ii) රේගු පරීක්ෂාවේ ස්වභාවය තීරණය කිරීම, ස්ක්‍රීනින් (Screening) අංශයට අනුයුක්ත නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂකවරු විසින් සිදු කෙරෙන අතර, ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. අදාල නිලධාරීන්ගේ පළපුරුද්ද සහ ආනයනකරුගේ ඉතිහාසගත තොරතුරු අනුව පරීක්ෂණ ක්‍රමවේදය තීරණය කෙරෙන බවට කරුණු ඉදිරිපත් කර තිබුණද, ආනයනකරුගේ ඉතිහාසගත තොරතුරු සහ වැරදි හඳුනාගැනීමට අදාල තොරතුරු පද්ධතියක් ස්ක්‍රීනින් අංශය තුළ ස්ථාපිත කර නොතිබුණු බැවින්, පරීක්ෂණ ක්‍රමවේදය නිලධාරීන්ගේ අභිමතය පරිදි තීරණය කෙරෙන බව නිරීක්ෂණය විය.

(iii) කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපල මගී පර්යන්තයේ පිහිටි රේගු ශාඛාවේ 2013 වර්ෂයේ රු.498,370,685 ක් වූ ආදායම 2014 වර්ෂයේදී රු.461,589,939 ක් දක්වා සියයට 7.38 කින් අඩුවී තිබුණි.

(iv) 2014 වර්ෂයේදී ගුවන් මගීන් 06 දෙනෙකු සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී එම මගීන් අවස්ථා 391 කදී රු.21,383,250 ක් වටිනා වාණිජ ස්වරූපයේ භාණ්ඩ මගී පර්යන්තය හරහා රැගෙන පැමිණ තිබුණි. ඒ සඳහා බදු වශයෙන් රු.6,488,782 ක්ද, දණ්ඩන වශයෙන් රු.10,742,625 ක්ද අය කර ගෙන තිබුණි. කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපල මගින් ලංකාවට පැමිණෙන හා පිටවෙන මගීන්ට සේවා සැපයීම අරමුණ වුවද, බොහෝ මගීන් විසින් ගුවන්තොටුපල භාවිතා කර වාණිජ ස්වරූපයේ භාණ්ඩ ශ්‍රී ලංකාවට රැගෙන එන බව නිරීක්ෂණය විය.

(v) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල වෙත 2013 වර්ෂයේදී දිනකට පැමිණි හා පිටවූ මගීන්ගේ සාමාන්‍ය පිළිවෙලින් 57 ක් හා 59 ක්ද, 2014 වර්ෂයේ දිනකට පැමිණි හා පිටවූ ගුවන් මගීන්ගේ සංඛ්‍යාව සාමාන්‍ය පිළිවෙලින් 45 ක් හා 55 ක් ද විය. එමෙන්ම 2013 වර්ෂයේ රැස්කළ ආදායම රු.23,019,686 ක් වුවද, 2014 වර්ෂයේදී එය රු.16,695,478 ක් දක්වා එනම් සියයට 27 කින් අඩු වී තිබුණි.

(vi) ත්‍රිකුණාමල රේගු නිවාරණ කාර්යාලයේ රේගු නිවාරණ කටයුතු සඳහා යාත්‍රා 02 ක් අනුයුක්ත කර තිබූ අතර එම යාත්‍රා දෙක අතුරින් ෆයිබර් ග්ලාස් වර්ගයේ මුර යාත්‍රාව 2004 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර මුහුදු වෙරළේ නවතා තැබීම හේතුවෙන් එම යාත්‍රාව විනාශයට පත්වෙමින් තිබුණි. C - 22 වර්ගයේ අනෙක් මුර යාත්‍රාව 2013 ජුනි 30 දිනෙන් පසුව සමුද්‍ර මුර සංචාරක කටයුතුවලින් ඉවත් කර රේගු නිවාරණ කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව රඳවා තිබුණි. එමෙන්ම 2013පෙබරවාරි 18 දින මෙම යාත්‍රාව අළුත්වැඩියා කිරීම සඳහා රු.92,780 ක් වැයකර තිබුණි. සමුද්‍ර මුර සංචාරක කටයුතු සඳහා යාත්‍රා රියදුරු සහ ලස්කාර් නිලධාරීන් අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් නිවාරණ කාර්යයන් සඳහා සමුද්‍ර මුර සංචාරක කටයුතු 2015 ඔක්තෝබර් 22 දින වන විටත් සතුටුදායක මට්ටමින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(vii) 2015 වර්ෂය වන විට නිෂ්පාදන බදු අංශයේ නිෂ්පාදන බදු ගෙවීම සඳහා ආයතන 135 ක් ලියාපදිංචි වී තිබුණි. 2015 ඔක්තෝබර් 22 දින වන විට බදු ගෙවීමට ක්‍රියාකාරීව ආයතන 38 ක් පැවැතිණි. අනෙකුත් ලිපිගොනු කලින් කළ නිෂ්පාදන බදු ඉවත් කිරීම මත වසා අවසන් කර තිබුණි. ලංකා දුම්කොල සමාගම හා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හැරුණු විට නිෂ්පාදන බදු ගෙවන අනෙක් ආයතන වෙතින් එකතු කරන ලද බදු වටිනාකම රැස්කල මුළු නිෂ්පාදන බදු ආදායමින් සියයට 3.4 කටත් වඩා පහළ මට්ටමක පැවතුණි. එමෙන්ම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි ආයතන හරහා නිෂ්පාදන බදු ගෙවීමට යටත් වන භාණ්ඩ නිෂ්පාදනය කරන නව ආයතන තවදුරටත් පවතීද යන්න හඳුනාගැනීමට ශ්‍රී ලංකා රේගුවේ නිෂ්පාදන බදු අංශය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(viii) නිෂ්පාදන බද්දට යටත් මෝටර් රථ එකලස් කිරීමේ ආයතනයකට කර්මාන්තශාලා මිල තුළ සියයට 30 ක දේශීය අගය එකතු කිරීම් මත කර්මාන්තශාලා මිල රු.8,553,631,500 ක් වූ වාහන 5057 ක් සඳහා රු.7,424,688,775 ක නිෂ්පාදන බදු සහනයක් ලබා දී තිබුණි. ඒ අනුව කර්මාන්තශාලා මිලෙන් සියයට 30 ක් එනම්, රු.2,566,089,450 ක් වූ දේශීය අගය එකතු කිරීම් වෙනුවෙන් ලබා දී ඇති බදු සහනය කර්මාන්තශාලා මිලෙන් සියයට 86.8 ක් හෙවත් රු.7,424,688,775 ක් විය.

(ix) වාහන එකලස් කිරීමේ ආයතනයක් විසින් නිෂ්පාදන බදු සහනය බලාපොරොත්තු වූ වාහන 410 ක් සම්බන්ධයෙන් දේශීයව එකතු කළ පිරිවැය දායකත්වය තහවුරු කිරීමට අපොහොසත් වීම මත අදාල නිෂ්පාදන බදු ගෙවිය යුතු බවට අධිකරණ තීන්දුවක් ලබා දී තිබුණද, එම වාහන 410 න් මේ වන විට වාහන 46 ක් සඳහා නිෂ්පාදන බදු අය කර නොතිබුණි. අදාල නිෂ්පාදන බද්ද ගෙවීමෙන් පසු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවීමට හැකි වුවත් මෙම වාහන 46 2014 දෙසැම්බර් 31 දින වන විටත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබීමත්, අදාල ගැණුම්කරුවන් මෙම මෝටර් රථ ව්‍යාජ ලෙස ධාවනයට යොදවා තිබිය හැකි බැවිනුත් උක්ත වාහන 2006, 2007, 2008 වර්ෂවල අලෙවි කර මේ වන විට වසර ගණනාවක් ඉක්මගොස් ඇති බැවිනුත් මේ සම්බන්ධව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ගයන් මොනවාද යන්න පැහැදිලි නොවීය. මෙම වාහන 46 සඳහා ආසන්න වශයෙන් රු.මිලියන 9.02 ක පමණ බදු මුදලක් අයවිය යුතුව පැවතුණි.

(x) සිද්ධි ලිපිගොනු සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- පුද්ගලික ආයතනයක් නමින්, 2012 ඔක්තෝබර් 09 දින ශ්‍රී ලංකාවට ලැබී තිබූ කේෂාලේප හා සුවඳ විලවුන් අඩංගු MSKU 6074095 දරන බහාළුම ආනයනය කළ ආයතනය විසින් නිදහස් කර ගැනීමට කටයුතු නොකර අදාල බහාළුම තම ඇණවුමක් මත ලැබූවක් නොවන බැවින් ප්‍රතිඅපනයනය කරන ලෙස 2012 නොවැම්බර් 05 දින දන්වා තිබුණද, එම ආයතනය විසින් මාස 03 කට පසුව එනම් 2013 පෙබරවාරි 11 දින නැවත ඉදිරිපත් කරන ලද ලිපිය අනුව ප්‍රතිඅපනයනයට හෝ රේගු බදු ගෙවා නිදහස් කර ගැනීම සඳහාද අවසර ඉල්ලා තිබුණි.

ඒ වන විටත් එනම්, 2012 නොවැම්බර් 05 දින වන විට මධ්‍යම පරීක්ෂණ අංශය විසින් රේගු පරීක්ෂණයක් ආරම්භ කර තිබුණු අතර, 2013 පෙබරවාරි 21 දින ශ්‍රී ලංකා රේගුවේ තක්සේරු අංශය විසින් මෙම භාණ්ඩවල වටිනාකම රු.19,761,606 ක් හා ඒ මත අයකළ යුතු රේගු හා අනෙකුත් බදුවල වටිනාකම රු.10,511,749 ක් ලෙස තක්සේරුකර තිබුණි. ඒ අනුව, මධ්‍යම අපහරණ අංශය මගින් අලෙවි කිරීමටත් නියෝග කර තිබුණි. එසේ තිබියදී මධ්‍යම අපහරණ අංශයේ ඉල්ලීම මත 2013 අප්‍රේල් 30 දින තක්සේරු අංශය විසින් එම භාණ්ඩ රු.2,152,215 කට එනම් රු.17,609,391 ක් අඩුවෙන් නැවත වරක් තක්සේරු කර තිබුණු අතර, එම වටිනාකම මත අදාල ආනයනය කළ ආයතනය වෙත අලෙවි කර තිබීමෙන් රු.28,121,140 ක ආදායමක් රජයට අහිමි වී තිබුණි.

- 2012 නොවැම්බර් 05 දින Kota Harmani නෞකාවෙන් ගොඩබාන ලද කේශාලේපන අඩංගු අංක BMOU 2552654 සහ අංක BMOU 2595487 දරන බහාළුම් දෙක ආනයනකරු විසින් භාර නොගැනීම නිසා රේගු මධ්‍යම පරීක්ෂණ අංශය විසින් රේගු පරීක්ෂණයක් 2012 දෙසැම්බර් 19 දින ආරම්භ කර තිබුණු අතර එහිදී මෙම ආනයනික භාණ්ඩවල වටිනාකම රු.14,729,263 ක් හා ඒ සඳහා ගෙවිය යුතු බදු ප්‍රමාණය රු.12,823,823 ක් ලෙස රේගු තක්සේරු අංශය විසින් තක්සේරු කර තිබුණි.

  පසුව භාණ්ඩ නිදහස් කර ගැනීම ප්‍රතික්ෂේප කළ ආයතනය විසින්ම අදාල භාණ්ඩ තොගය සම්පූර්ණ බදු මුදල් ගෙවා නිදහස් කර ගැනීමට 2013 පෙබරවාරි 20 දින ඉල්ලීමක් කර තිබියදීත් ඒ සඳහා අවසරය ලබා නොදී මධ්‍යම පරීක්ෂණ අංශය විසින් සිදුකළ රේගු පරීක්ෂණයෙන් අනතුරුව 2013 මාර්තු 28 දින ආනයනික භාණ්ඩ රාජසන්තක කිරීමට නියෝග කර තිබුණි. රු.14,729,263 කට තක්සේරු කර තිබූ භාණ්ඩ තොගය පසුව එනම් 2013 අප්‍රේල් 09 දින නැවත රු.5,505,377 කට එනම් රු.9,223,886 ක් අඩුවෙන් තක්සේරු කර ආනයනික අවස්ථාවේදී භාර ගැනීම ප්‍රතික්ෂේප කළ ආයතනයටම බදු ඇතුළත්ව රු.6,474,324 කට ලබා දීමට කටයුතු කර තිබීමෙන් රු.21,078,762 ක ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(xi) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් 2014 අගෝස්තු 14 දිනැති 1875/30 අංක දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින්, භාණ්ඩ සංයෝජිත අංක 0701.90 යටතේ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන අර්තාපල් කිලෝග්‍රෑම් 01 ක් සඳහා එතෙක් අයකළ රු.5 ක විශේෂ වෙළඳ බද්ද 2014 අගෝස්තු 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.15 දක්වා වැඩිකර තිබුණද, 2014 අගෝස්තු 15 දින හා ඊට පසුව කොළඹ වරායට පැමිණි නෞකා 4 ක් මගින් රැගෙන එන ලද අර්තාපල් කිලෝග්‍රෑම් 1,184,320 කට අදාලව විශේෂ වෙළඳ බද්ද ලෙස කිලෝග්‍රෑම් 01 කට රු.5 ක් පමණක් ආනයනකරුවන්ගෙන් අය කිරීමට ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් කටයුතු කර තිබීම හේතුවෙන් රු.11,843,200 ක බදු ආදායමක් අහිමි වී තිබුණු අතර මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම විමර්ශන අංශය විසින් රේගු විමර්ශනයක්ද ආරම්භ කර තිබුණි.

(xii) සනීපාරක්ෂක උපාංග ලෙස අනාවරණය කර ඉන්දියාවේ සිට කොළඹ වරාය හරහා ඩුබායි දක්වා ප්‍රවාහනය කරමින් තිබූ බහාළුමක් 2013 නොවැම්බර් 09 දින රේගු නිලධාරීන් විසින් පරීක්ෂා කිරීමේදී එම බහාළුම තුළ මෙ.ටො. 6.74 ක් බරැති රු.මිලියන 33.7 ක වටිනාකමින් යුතු සඳුන් දැව තොගයක් අඩංගු බව අනාවරණය කර ගෙන තිබුණු අතර 2013 නොවැම්බර් 14 දින ශ්‍රී ලංකා රේගුවේ නිවාරණ අංශය විසින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර තිබුණි. එම විමර්ශනයෙන් අනතුරුව 2014 අගෝස්තු 13 දින මූලික විමර්ශන නිලධාරියා විසින් මෙම දැව තොගය රේගු ආඥා පනතේ 37 වගන්තිය හා 2007 ඔක්තෝබර් 03 දිනැති අංක 1517/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව රාජසන්තක කිරීමට නියෝග කර එදිනම එම නියෝගය රේගු ආඥා පනතේ 163 වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබී ඇති බලතල මත රු.මිලියන 5 ක ලිහිල් දණ්ඩනයක් යටතේ නිදහස් කර හොංකොං රාජ්‍ය වෙත අපනයනය කිරීමට නෞකා නියෝජිත ආයතනය නම් කළ පුද්ගලයෙකු වෙත අවසරය ලබා දී තිබුණි. ඒ අනුව පසු දින එනම් 2014 අගොස්තු 14 දින රු.මිලියන 5 ක දණ්ඩන මුදල අයකර ගෙන තිබුණද සඳුන් දැව තොගය නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. පසුව රේගු අධ්‍යක්ෂවරයා විසින් ඉහත ලබාදුන් තීන්දුව අවලංගු කර රු.මිලියන 5 ක දණ්ඩන මුදල එම පුද්ගලයා වෙත ආපසු ගෙවීම සඳහා 2014 ඔක්තෝබර් 03 දින නියෝග කර තිබුණි. මේ සම්බන්ධව පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

- නෞකා නියෝජිතයා විසින් නම් කරනු ලැබූ පුද්ගලයා සම්බන්ධයෙන් භාණ්ඩ එවනු ලැබූ හෝ ලැබිය යුතු පාර්ශවයන්ගෙන් කරුණු විමසීමක් සිදු නොකර රු.මිලියන 33.7ක වටිනාකමින් යුතු සඳුන් දැව තොගය රු.මිලියන 5 ක දණ්ඩනයක් පමණක් අයකර ගෙන නිදහස් කිරීමට නියෝගයක් ලබා දී තිබීම.

- ඉන්දියාවේ සිට ඩුබායි දක්වා ප්‍රවාහනය කරමින් තිබූ දැව තොගය රේගු විමර්ශනයෙන් අනතුරුව හොංකොං රාජ්‍යය වෙත අපනයනය කිරීමට කුමන පදනමකින් නියෝග කර තිබුණේද යන්න අනාවරණය නොවීම.

- රේගු ආඥා පනතේ 163 වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂවරයා ප්‍රතිශෝධනය කර ලබාදුන් නියෝගයක් නැවත ප්‍රතිශෝධනය කිරීමේ බලය මුදල් අමාත්‍යවරයා සතු වුවද, දණ්ඩන වශයෙන් අයකරගත් රු.මිලියන 5 ක මුදල ආපසු ගෙවීම සඳහා මුදල් අමාත්‍යවරයාගෙන් අනුමැතියක් ලබා ගෙන නොතිබීම.

- රේගු ආඥා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව රේගු විමර්ෂනයක තීන්දුවක් සම්බන්ධයෙන් එකඟ නොවන පාර්ශවයට එම තීන්දුව ලබාදී මාසයක කාලයක් ඇතුළත අධිකරණය ඉදිරියේ නඩු පැවරිය හැකි අතර අදාල පාර්ශවය එවැනි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අවස්ථාවක එකී වරද සම්බන්ධයෙන් පැනවූ දණ්ඩන හා රාජසත්තක මුදල් රේගු ආඥා පනතේ 153 (1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට, කළමනාකරණ වන්දි අරමුදලට හා නිලධාරීන්ගේ ත්‍යාග ගෙවීමට අදාල ප්‍රමාණයන් හඳුනාගෙන ගෙවීමට කටයුතු කළ යුතුය. එසේ වුවද, ඉහත විමර්ශනයේදී දණ්ඩනයට යටත් වූ පුද්ගලයා අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබියදීත් රු.මිලියන 5 ක මුදල තැන්පත් ගිණුමේ රඳවාගෙන මාස 02 කට පමණ පසු විධිමත් අනුමැතියකින් තොරව එම පුද්ගලයා වෙත ආපසු ගෙවීමට කටයුතු කර තිබීම.

- මෙම විමර්ශනයේදී ලබා දුන් නියෝගය නිවැරදි නොවන බවට රේගු නිලධාරීන් ඉදිරිපත් කර තිබූ නියෝජනයන් හේතුවෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයේ තීන්දුව අහෝසි කර දැව තොගය නිදහස් නොකිරීමටත් නැවත විමර්ශනයක් ආරම්භ කිරීමටත් කටයුතු කර තිබීම.

(xiii) 2013 ජනවාරි 03 දින සිට 2014 අගෝස්තු 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ පළාත් සභා නියෝජනය කරන මහජන නියෝජිතයන් විසින් BMW 730 D SE මාදිලියේ වාහන 12 ක් ආනයනය කර තිබුණු අතර එම සියළුම අවස්ථාවලදී වාහනයේ ආනයනික මි.ර.ගැ.(CIF) වටිනාකම බලපත්‍රයේ සඳහන් සීමාව නොඉක්මවන අයුරින් ඇමෙරිකානු ඩොලර් 45,000 ක් ලෙස සඳහන් කර බදු ගෙවීමට කටයුතු කර තිබුණි. නමුත් මෙම මාදිලියේ වාහනයක වටිනාකම සම්බන්ධයෙන් අන්තර්ජාල වෙබ් අඩවි පරීක්ෂා කිරීමේදීද සම්මත අමතර කොටස් සමඟ මි.ර.ගැ. (CIF) වටිනාකම බ්‍රිතාන්‍ය පවුම් 45,000 කට (ආසන්න වශයෙන් අමෙරිකානු ඩොලර් 74,000) ආසන්න වන බව නිරීක්ෂණයවූ අතර 2015 ජනවාරි 15 දිනැති අංක MV/01/2015 දරන ශ්‍රී ලංකා රේගු මිල කමිටු වාර්තාව මගින්ද සම්මත වටිනාකම යූරෝ 42,500 ක් ලෙස නියම කර තිබුණි. එවැනි ඉහල වටිනාකමක් ඇති වාහන, බලපත්‍රයේ සඳහන් උපරිම සීමාව ඉක්මවා නොයන අයුරින් ඌන තක්සේරුකර බදු ගෙවීමට ආනයනකරුවන් විසින් කටයුතු කර තිබීම නිසා වාහන 12 ක් මඟින් පමණක් රු.352,604,621 ක රේගු බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(xiv) ඩබල් කැබ් (Double Cab) මාදිලියේ වාහන නිෂ්පාදනය කර ඇති ස්වරූපයට සමාන අයුරින් නිෂ්පාදනය කර තිබුණු ටොයොටා හිලුක්ස් ස්මාර්ට් කැබ් (Totoya Hilux Smart Cab) මාදිලියේ වාහන සඳහා බදු අය කිරීමට පදනම් කරගෙන තිබුණේ සිංගල් කැබ් මාදිලියේ වාහන සඳහා අයකරනු ලබන රේගු බදු අනුපාතයම වන අතර එය ඩබල් කැබ් වාහන සඳහා අයකර ඇති බද්ද හා සැසඳීමේදී එක් වාහනයකින් රු.මිලියන 1 ක් පමණ අඩුවෙන් අයකර ගැනීමක් විය. ශ්‍රී ලංකා රේගුව විසින් ටොයොටා හිලුක්ස් ස්මාර්ට් කැබ් මාදිලිය සඳහා බදු අය කිරීමට නව භාණ්ඩ සංයෝජිත වර්ගීකරණයක් 2014 වර්ෂයේදී හඳුන්වා දුන්නද ඒ වන විටත් වාහන 3000 ක් පමණ ශ්‍රී ලංකාවට ආනයනය කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි.

(xv) දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති 2010 දෙසැම්බර් 10 දිනැති අංක 01/2010 දරන හා 2013 අගෝස්තු 02 දිනැති අංක 01/2013 දරන වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ මගින් රජයේ සේවකයන් සඳහා නිකුත් කර ඇති සහනදායී බලපත්‍ර මත ආනයනය කරනු ලබන ඉතා ඉහළ වටිනාකමින් යුතු අධි සුඛෝපභෝගී වාහන සහනදායී බලපත්‍රයේ වටිනාකමේ උපරිම සීමාවට ගැලපෙන ලෙස ඌන තක්සේරු කිරීම මගින් ඉතා ඉහළ රේගු බදු ලැබිය යුතු වාහන අඩු රේගු බද්දක් ගෙවා නිදහස් කර ගැනීමට කටයුතු කර ඇති බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(xvi) පාවිච්චි කරන ලද වාහන ආනයනය කිරීමේදී රේගු බදු ගණනය කිරීමේ කටයුතු සඳහා වටිනාකම ලෙස පදනම් කර ගනු ලබන්නේ ඉන්වොයිසියේ සඳහන් කර ඇති වාහනයේ වටිනාකම හෝ එක් එක් වාහන මාදිලියන් සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් තීරණය කර ඇති සම්මත වටිනාකම (ක්ෂය, නැව්කුලී, රක්ෂණ යනාදි වියදම් ගැලපූ පසු) යන දෙකෙන් වැඩි වටිනාකම වේ. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකාවට ආනයනය කර තිබූ මර්සිඩීස් බෙන්ස් (Mercedes Benz) E 220 මාදිලියේ වාහන 03 කට අදාලව බදු අය කිරීමේදී ඉන්වොයිසියේ සඳහන් වටිනාකම මතම බදු ගණනය කර තිබීම හේතුවෙන් වාහන 3 කින් රු.4,608,730 ක රේගු බදු මුදලක් අඩුවෙන් අයකර තිබුණි.

(xvii) රජයේ සේවකයන්ට හිමි සහනදායී වාහන ආනයන බලපත්‍ර දෙකක් යටතේ 2013 දෙසැම්බර් 03 දිනැති CBMVI 5839 හා CBMVI 5840 අංක දරන රේගු සටහන්කර දෙක මගින් බී.එම්.ඩබ්. M5මාදිලියේ සිලින්ඩර ධාරිතාවය 4395 ක් වූ පාවිච්චි කරන ලද වාහන 2 ක් ආනයනය කර තිබූ අතර එම වාහනයක ඉන්වොයිස් වටිනාකම ඇමෙරිකන් ඩොලර් 24,444.51 ක් ලෙස අනාවරණය කර තිබුණි. එම වටිනාකම් පදනම්ව එක් වාහනයකින් රු.3,247,383 ක මුදලක් බැගින් රු.6,495,766 ක් රේගු බදු ලෙස අයකර තිබුණි. මෙම වාහන මාදිලියන් සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ස්ථාවර මිලක් තීරණය කර ඇති බවට සාක්ෂීන් නොතිබූ අතර මීට සමාන මාදිලියන් යටතේ ආනයනය කරනු ලබන වාහනවල ස්ථාවර මිලගණන් හා සැසඳීමේදී මෙම වාහන මාදිලිය සඳහා ඇමෙරිකන් ඩොලර් 35,000 කට වඩා ඉහළ ස්ථාවර මිලක් නියම විය යුතු අතර එම ස්ථාවර මිල සැලකිල්ලට ගෙන රේගු බදු ගණනය කිරීමේදී එක් වාහනයකින් අයකළ යුතු

රේගු බදු මුදල රු.7,100,468 කි. ඒ අනුව මෙම වාහන දෙකෙන් අවම වශයෙන් රු.7,705,170 ක රේගු බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි. ආනයනකරුවන් ඉදිරිපත් කළ අභියාචනා සැලකිල්ලට ගෙන ඉන්වොයිසියේ සඳහන් වටිනාකම පදනම් කරගෙන බදු ගණනය කිරීම කළ බව රේගු නිලධාරීන් ප්‍රකාශ කළද එම අභියාචනා 2015 ඔක්තෝබර් 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(xviii) 2013 නොවැම්බර් 01 දින සිට 2014 මැයි 16 දින දක්වා රේගු සංයෝජිත අංක 8705 යටතේ විශේෂිත කාර්යය වාහන ලෙස ආනයනය කරන ලද වාහන විසිදෙකක් (22) ද්විත්ව කාර්යය වෑන් රථ ලෙසද වාහන පනස්හයක් (56) මෝටර් ලොරි ලෙසද 2010 වර්ෂයේ සිට 2013 ඔක්තෝබර් 31 දින දක්වා විශේෂිත අරමුණු සඳහා ආනයනය කරන ලද කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරිරථ (Concrete Mixer Lorry) ඇතුළුව වාහන 358 ක් මෝටර් ලොරි ලෙසද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය. ඒ අනුව එම රථවලට එකී විශේෂිත අරමුණුවලින් බැහැරව සාමාන්‍ය ට්‍රක්රථයක් හෝ ලොරි රථයක් ලෙස පරිහරණය කිරීමට ඉඩකඩ ලැබී තිබුණි. සාමාන්‍ය වෑන් රථ සහ ට්‍රක් රථ විශේෂිත අරමුණු සඳහා යොදා ගනු ලබන වාහන ලෙස ආනයනය කිරීම මගින් සාමාන්‍ය වෑන් රථයක් ලෙස ආනයනය කිරීමේදී ගෙවිය යුතු රේගු බදු මුදල රුපියල් ලක්ෂ 15 ත් රුපියල් ලක්ෂ 30ත් අතර ප්‍රමාණයකින්ද, ට්‍රක් රථයක් ලෙස ආනයනය කිරීමේදී ගෙවිය යුතු රේගු බදු මුදල රුපියල් ලක්ෂ 5 ත් රුපියල් ලක්ෂ 20 ත් අතර ප්‍රමාණයකින්ද, අඩුකර ගැනීමේ වංචනික අරමුණින් පෞද්ගලික ආයතන කිහිපයක් විසින් මෙලෙස වාහන ආනයනය කර තිබුණි. ඒ අනුව 2010 වර්ෂයේ සිට 2014 මැයි 16 දින දක්වා ආනයනය කළ වෑන් රථ 22 කින් සහ ට්‍රක් රථ 414 කින් අවම වශයෙන් රුපියල් මිලියන 243 ක රේගු බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(xix) භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගැනීමේ මූලික අරමුණින් යුතු අඩු රේගු බදු ගෙවිය යුතු රේගු සංයෝජිත අංකයන් යටතේ ආනයනය කරන ලද වාහන මෙරටදී මගීන් ප්‍රවාහන කටයුතු සඳහා භාවිතයට ගනු ලබන සුඛෝපභෝගී මෝටර් වාහන බවට පරිවර්තනය කිරීම හේතුවෙන් විශාල රේගු බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි. මේ පිළිබඳ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- අන්තර්ජාල වෙබ් අඩවිවල වාහන විකිණීමට අදාලව පළකල දැන්වීම් හා මාර්ගයේ ගමන් කරන වාහන සම්බන්ධව සිදු කළ විගණන පරීක්ෂාවේදී අනාවරණය වුයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ “PP” සිට “PY”දක්වා වාහන හඳුනා ගැනීමේ ඉංග්‍රීසි අකුරු කාණ්ඩ යටතේ ද්විත්ව කාර්ය සිංගල් කැබ් රථ ලෙස ලියාපදිංචි කරනු ලැබූ වාහන 13 ක්ද, “L”වාහන හඳුනා ගැනීමේ ඉංග්‍රීසි අකුරු කාණ්ඩ යටතේ මෝටර් ලොරි (සිංගල් කැබ්රථද ඇතුලුව) ලෙස ලියාපදිංචි කරනු ලැබූ වාහන 04 ක්ද, “PA” සිට “PM”දක්වා වාහන හඳුනා ගැනීමේ ඉංග්‍රීසි අකුරු කාණ්ඩ යටතේ ඩබල් කැබ් රථ හා වෑන් රථ ලෙස ලියාපදිංචි කරනු ලැබූ වාහන 04 ක්ද ලියාපදිංචි කිරීමෙන් පසුව මෝටර් කාර් ලෙස පරිවර්තනය කර ඇති බව අනාවරණය විය. මෙම වාහන ආනයනය කිරීමේදී මෝටර් කාර් ලෙස සළකා බදු ගණනය කලේ නම් ඉහත වාහන 21 අතුරින් වාහන 16 කින් පමණක් රේගු බදු ලෙස රු.91,460,000 ක ආදායමක් උපයා ගත හැකිව තිබුණි.

- වාහන ලියාපදිංචි කිරීමේ අංක 24, 25, 31, 32, 40, 50, 51, 64, සහ 65 ඇතුළු ඉතා පැරණි ඉලක්කම් අංක කාණ්ඩ යටතේ ලියාපදිංචි කරන ලද ඉතා නවීනතම සුඛෝපභෝගී වාහන රාශියක්ද ඊට අමතරව ඉහත වාහන ලියාපදිංචි කිරීමේ අංක යටතේ මුල් ලියපදිංචිය සිදු කර පසුව "E" ඉංග්‍රීසි අකුරු කාණ්ඩ අංක ලබාගත් නව මාදිලියේ පරිවර්තිත නවීනතම සුඛෝපභෝගී වාහන විශාල ප්‍රමාණයක්ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි.

- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 14 වන වගන්තියේ දැක්වෙන පරිදි පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව නිෂ්පාදන බදු සඳහා ලියාපදිංචි නොවූ පෞද්ගලික ආයතනයක් විසින් සිංගල් කැබ් රථ හා ඩබල් කැබ් රථ පසුව දොර පහේ ස්ටේෂන්වැගන් රථ බවට (ලෑන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් ජීප්රථ) පරිවර්තනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන

යන අතර මෙම පරිවර්තනයන් සඳහා රු. මිලියන 1.4 සිට රු.මිලියන 2.4 ක මුදලක් අයකර තිබුණි.

- ඉහත ආයතනය විසින් වංචනික ලෙස පරිවර්තනය කරන ලද වාහන විශාල සංඛ්‍යාවක් රට තුළ පවතින බව නිරීක්ෂණය වූ අතර වාහන වංචනිකව පරිවර්තනය කිරීමත් ඒ සඳහා අන්තර්ජාල වෙබ් අඩවි හරහා ප්‍රචාරණයන් සිදු කරමින් ප්‍රසිද්ධියේ පවත්වාගෙන යාහැකි ව්‍යාපාරයන් පැවතීම දක්වා වර්ධනය වීම මගින් නිරීක්ෂණය වන්නේ, නිෂ්පාදන බදු පනතේ පවත්නා විධිවිධාන උල්ලංඝණය කර ඇති බවයි.

- ආනයන අපනයන පාලන නීති රීතිවලට අනුව වසර 02 කට වඩා පැරණි පුද්ගල ප්‍රවාහන මෝටර් රථ (රේගු සංයෝජිත අංක 8703 යටතේ) සහ වසර 04 කට වඩා පැරණි භාණ්ඩ ප්‍රවාහන මෝටර් රථ (රේගු සංයෝජිත අංක 8704 යටතේ) ආනයනය කිරීම තහනම් වේ. ඒ අනුව වසර 04 ක් දක්වා පැරණි සිංගල් කැබ් රථ හා ඩබල් කැබ් රථ ආනයනය කර පුද්ගල ප්‍රවාහන මෝටර් රථ බවට පරිවර්තනය කිරීම මගින් වසර 02 කට වඩා පැරණි පුද්ගල ප්‍රවාහන මෝටර් රථ ආනයනය කිරීමේ තහනම ඉක්මවා කටයුතු කිරීමට හැකිවීමෙන් ආනයන අපනයන පාලන රෙගුලාසි ඉතා බරපතල ලෙස උල්ලංඝනය කර තිබුණි. එසේම මෙම හේතුව මත වසර 04 දක්වා පැරණි ජීප්, සිංගල් කැබ් රථ හා ඩබල් කැබ් රථ ආනයනය කර මෝටර් කාර් රථ බවට පරිවර්තනය කර පරිහරණය කිරීමට හැකියාව ලැබී ඇති බැවින් රේගුව විසින් වාහන සඳහා අය කෙරෙන රේගු බදු ආදායම අඩුවීම සඳහාද මෙම තත්ත්වය හේතුවී තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 24701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.10,809,826 ක් වූ හිඟහිටි ණය ශේෂවලින් රු.7,672,767 ක් 2015 ඔක්තෝබර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 1994 අගෝස්තු 18 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදය පරිදි අදාල උපලේඛනවල නිලධාරීන්ගේ මිය ගිය, විශ්‍රාම ගිය දිනය සඳහන් කළ යුතු වුවත්, අදාල වර්ෂය පමණක් සඳහන් කර තිබුණි.

(ඇ) මියගිය, විශ්‍රාම ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂයන් ආපසු අය කිරීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 ඡේදය අනුව කටයුතු නොකිරීම හේතුවෙන් එම අත්තිකාරම් ශේෂ චලනය නොවූ ණය ශේෂයන් ලෙස පැවතිණි.

(ඈ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර තවදුරටත් පැවති රු.95,820 ක් වූ වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

(ඉ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 11 දෙනෙකුගේ එකතුව රු.875,306 ක් වූ ණයශේෂ මුදල් රෙගුලාසි 485(4) ප්‍රකාරව හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1:1:6 හා 1:1:7 ඡේද ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි.

(ඊ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එනු ලබන එකතුව රු.5,133,031 ක් වූ විශ්‍රාම ගිය, මිය ගිය, වැඩතහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. මේ පිළිබඳව ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 04 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(උ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.1.3 හා 11.9.1 වගන්ති ප්‍රකාරව ණය මුදල ලබාගෙන සති 6 ක් ඇතුළත ඔප්පුව ඉදිරිපත් නොකළහොත් ණය මුදල වහාම ආපසු අය කළ යුතු අතර, එසේ නොකළහොත් මුළු ණය මුදල ගෙවා අවසන් වනතුරු මාසික ණය වාරිකය දෙගුණ කර පොළිය සියයට 5 කින් වැඩි කළ යුතු වුවත්, අවස්ථා 03 කදී එසේ කටයුතු කර නොතිබුණි.

**3.7 අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂය සඳහා වූ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන්ද විගණන මතයක් ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.24,618,348 ක් වූ අතර, එම හිඟ හිටි අත්තිකාරම් පියවා ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) හිඟ ශේෂ (නොපියවූ අත්තිකාරම්) පියවීමට කටයුතු නොකර 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අතිරේක ලැබීම් ලෙස දක්වා තිබූ රු.2,502,415 ක්වූ ශේෂ 337 ක් රජයේ ආදායමට බැරකර තිබුණි.

(ඇ) වියදම් සඳහා අත්තිකාරම් මුදල් ලබාගත් යම් සිද්ධියක් පිළිබඳව විමර්ශන කටයුතු කරගෙන යාමේදී එම සිද්ධියෙහි රේගු වැරදි නොමැති බව නිරීක්ෂණය වීමෙන් පසු එකී සිද්ධියට අදාල රේගු විමර්ශන කටයුතු නවතා දමන අවස්ථාවලදී එම විමර්ශන සඳහා ලබාගත් අත්තිකාරම් මුදල ආවරණය කරගත හැකි ක්‍රමවේදයක් නොතිබුණි.

(ඉ) වාර්තා හා ලේඛන නිසි පරිදි පවත්වාගෙන නොයාම, අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

## 3.8 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 3.8.1 වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.8.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 ජුලි 09 දින ඉදිරිපත් කර තිබුණි.

### 3.8.3 විගණන හා කළමනාකරණ කමිටුව

---

විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් කාර්තුවකට එක් වරක් හෝ පැවැත්විය යුතු වුවත්, 2014 වර්ෂය සඳහා රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 3.9 වත්කම් කළමනාකරණය

ශ්‍රී ලංකා රේගුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) වත්කම් ලේඛනගත කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කළමනාකරණ හා වන්දි අරමුදලේ, අරමුදල් මගින් 2013 සහ 2014 වර්ෂවල මිලදී ගන්නා ලද පිළිවෙලින් රු.78,683,345ක් හා රු.5,031,062 ක් වූ පරිගණක හා පරිගණක උපාංග, පරිගණක ලේඛනයක සටහන් කර නොතිබුණි.

(ii) කළමනාකරණ හා වන්දි අරමුදල්වලින් 2013 සහ 2014 වර්ෂවල මිලදී ගත් පිළිවෙලින් රු.84,656,355ක් සහ රු.7,133,531ක් වූ ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(iii) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව සහ 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009/(02) කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 02 හා 03 ඡේදවල විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් නිවැරදිව වාර්තා ගත කළ යුතු වුවත්, 2013 සහ 2014 වර්ෂවලදී මිලදී ගත් එකතුව රු.810,724,986 ක් වූ ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 802(iii) ප්‍රකාරව සහ 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009/(02) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 4.2 ඡේදය පරිදි වාහන පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයේ වාහනවලට අදාළ සියළු තොරතුරු සටහන් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

### (ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලබේ.

(i) බහාළුම් පරීක්ෂණ කටයුතු සඳහා සියයට 7.03 ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ ලංකා බැංකුවෙන් ලබාගත් ඇමරිකන් ඩොලර් 15,600,000 ක ණය

මුදලක් උපයෝජනය කර 2005 වර්ෂයේදී මිලදී ගෙන තිබූ ස්කෑන් යන්ත්‍ර 4 න් 2 ක් නිෂ්ක්‍රීයව පැවති අතර ඉතිරි යන්ත්‍ර 2 ඌන උපයෝජිතව පැවතුණි.

(ii) ශ්‍රී ලංකා රේගුව විසින් රු.859,500 ක් වැයකර මිලදී ගෙන තිබුණු ඇඟිලි සළකුණු යන්ත්‍ර 07 ක් මේ වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. රේගු නිලධාරීන් විසින් ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතය ප්‍රතික්ෂේප කිරීම සහ නව රේගු ගොඩනැගිල්ලේ කටයුතු ආරම්භ කිරීමෙන් පසු මෙම යන්ත්‍ර ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබීම මේ සඳහා මූලික වශයෙන් හේතු වී තිබුණි.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 3.6 ඡේදය අනුව භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ අංශ 54 කට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 ඔක්තෝබර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයේදී භාණ්ඩ මිලදී ගැනීම් සහ අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු 2006 ජූලි 30 දිනැති අංක 422 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ඇමුණුම ප්‍රකාරව ලේඛනගත කර එම වාර්තාව මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල්වරයා වෙත යැවූ බවට සාක්ෂි ඉදිරිපත් නොවිණි.

**(ඈ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**-----------------------------------------**

ශ්‍රී ලංකා රේගුව සතු ඉඩම් රේගුවේ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයක් විසින් භාවිතා කරන බව නිරීක්ෂණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකා රේගුව විසින් නීත්‍යානුකූල පැවරීමකින් තොරව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අඩි 36' X 15' ප්‍රමාණයේ ඉඩමක් ලබා දී තිබුණි.

(ii) ශ්‍රී ලංකා රේගුවට අයත් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ඇති ඇතැම් ඉඩම් නීත්‍යානුකූල පැවරීමකින් තොරව ත්‍රිවිධ හමුදාවේ භාවිතයට ලබා දී තිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

----------------------------

ශ්‍රී ලංකා රේගුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.74,098,634 ක් වූ බැරකම්වලින් රු.7,900,000 ක් 2015 ඔක්තෝබර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 නොවැම්බර් 04 දිනැති අංක 238/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3:11 ඡේදය පරිදි 2014 වර්ෂය අවසානයේ පියවීමට අදාල බැරකම් ලෙස රු.74,098,634 ක් දක්වා තිබුණත්, 2014 වර්ෂයේදී එම බැරකම්වලට අමතරව රු.26,415,680 ක බැරකම් 2015 වර්ෂයේදී නිරවුල් කර තිබුණි.

(ii) 2015 වර්ෂයට අදාල රු.327,567 ක් වූ ගෙවීම් 2014 දෙසැම්බර් 31 දිනට පැවති බැරකම් ලෙස DGSA 8 (I) බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

## 3.10 අනුකූල නොවීම

--------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | | 190 පොදු ආකෘති පත්‍රය අනුව නිවාඩු පිළිබඳ රෙජිස්ටරයක් තබා ගත යුතු වුවත්, සමහර අංශවල එවැනි රෙජිස්ටරයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) XII පරිච්ඡේදයේ 22.4 වගන්තිය | | වැටුප් රහිත නිවාඩු පිළිබඳව 96 වැනි පොදු ආකෘතිය ප්‍රකාරව විගණකාධිපති වෙත මාස්පතා වාර්තා කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) XV පරිච්ඡේදයේ 3.1 වගන්තිය | | ස්වකීය පත්වීම් කොන්දේසිය අනුව සේවයේ ස්ථිර කරනු ලැබීම පිණිස ලබා ගත යුතු කිසියම් සුදුසුකමක් ලබා ගැනීම සඳහා මිස, පරිවාස පිට සිටින නිලධාරියෙකු අධ්‍යයන හෝ අභ්‍යාස සඳහා පිටරට නොයැවිය යුතු වුවද, එක් නිලධාරියෙකු සම්බන්ධයෙන් ඊට පටහැනි ලෙස කටයුතු කර තිබුණි. |
| (iv) XXVIII වැනි පරිච්ඡේදයේ 1.3 වගන්තිය | | කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල මගී පර්යන්ත රේගු කාර්යාලයේ පැමිණීමේ ලේඛනය මාණ්ඩලික නිලධාරියෙකු විසින් අධීක්ෂණය කර නොතිබුණි. |
| (v) LVIII වැනි පරිච්ඡේදයේ 1.3 වගන්තිය | | මූලික විමර්ශනයන් නොපමාව නිම කිරීමට අදාලව සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන් වගබලා ගත යුතු වුවත්, එසේ කටයුතු නොකළ අවස්ථා විය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 115(4) | 149,892 | ගතවූ මුදල් වර්ෂවලට හිමිකම් පෑමේදී එම ගෙවීම් කිරීමට ප්‍රථම ඒ සඳහා බලය දෙමින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් නිකුත් කරන ලිපියේ පිටපතක් |

විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි .

(ii) මුදල් රෙගුලාසි 447

පොදු 138 ආකෘතිය යටතේ විසර්ජන ලෙජරයේ එක් එක් වැය විෂයයන් සඳහා සළසා දෙනු ලබන ප්‍රතිපාදන හා ඊට පසු ලබා ගන්නා අතිරේක ප්‍රතිපාදන සටහන් කර මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කර නොතිබුණු අතර, මුදල් රෙගුලාසි 66 ප්‍රකාර ප්‍රතිපාදන මාරු කිරීම් සටහන් කර නොතිබුණු අතර ගෙවීම් කිරීමේදී ගෙවීම් වවුචරයේ අංකයද සඳහන් කර නොතිබුණි. වැය විෂයයන් 30 ක් අතරින් වැය විෂයයන් 22 ක සමුච්චිත වියදම සඳහන් කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 447 (1) හා (4) -

විසර්ජන (සම්මත) වැය ලෙජරයේ එළඹ තිබුණු බැරකම් සඳහන් කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 272 -

2014 වර්ෂයට අදාල ගෙවීම් වවුචර් මිටි බැද ආරක්ෂාකාරීව තබා නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 396(ඇ)

නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**----------------------------**

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009(1) දරන චක්‍රලේඛයේ 02(1) ඡේදය

කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල මගී පැමිණීමේ පර්යන්තයේ රේගු කාර්යාලට අනුයුක්ත නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කෙරෙන ඇඟිලි සළකුණු යන්ත්‍රයක් ස්ථාපිත කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රේගුවේ චක්‍රලේඛ**

| | |
|---|---|
| 2010 දෙසැම්බර් 19 දිනැති අංක 01/2010 දරන චක්‍රලේඛයේ 4 ඡේදය | කටුනායක ගුවන්තොටුපල මගී පර්යන්ත කාර්යාලයේ බැහැරයාමේ ලේඛනයක් පවත්වා තිබුණත්, 2013 ජූනි මාසයේ සිට 2015 පෙබරවාරි 25 දින දක්වා කාල පරාසයක තුළ අවස්ථා 05 කදී පමණක් සටහන් කර තිබුණි. |

## 3.11 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ශ්‍රී ලංකා රේගුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ආදායම් එකතු කිරීම**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත බදු ආදායම හා තත්‍ය බදු ආදායම ඉකුත් වර්ෂයේ බදු ආදායම් සමඟ සසඳා පහත දැක්වේ.

| බදු වර්ගය | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ඇස්තමේන්තු අනුව බදු ආදායම | තථ්‍ය බදු ආදායම | තත්‍ය බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස | සංශෝධිත ඇස්තමේන්තු අනුව බදු ආදායම | තථ්‍ය බදු ආදායම | තත්‍ය බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
| | රු.මිලියන | රු.මිලියන | | රු .මිලියන | රු.මිලියන | |
| **විදේශ වෙළඳාම මත බදු** | | | | | | |
| ආනයන බදු | 85,000 | 77,726 | 91.44 | 82,591 | 74,668 | 90.41 |
| අපනයන බදු | 25 | 24 | 96 | 20 | 22 | 110 |
| වරාය හා ගුවන්තොටුපල බදු (ආනයන) | 80,000 | 68,646 | 85.81 | 61,004 | 61,506 | 100.82 |
| සෙස් බදු - (ආනයන) | 40,000 | 35,622 | 89.06 | 37,362 | 33,004 | 88.34 |
| මෝටර් රථ අනුග්‍රහක බදු | - | - | - | - | - | - |
| ප්‍රාදේශීය යටිතල පහසුකම් බදු | - | - | - | - | 1 | - |
| සෙස් බදු - | 5,000 | 3,084 | 61.68 | 3120 | 3,087 | 98.94 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (අපනයන) | | | | | | |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 65,000 | 47,952 | 73.77 | 50,106 | 46,705 | 93.21 |
| වෙනත් | - | - | - | - | - | - |
| **නිෂ්පාදන බදු** | | | | | | |
| සිගරට් | 61,000 | 57,204 | 93.78 | 58,222 | 58,534 | 100.54 |
| මත්පැන් | - | 12 | - | - | 0.1 | - |
| බණිජතෙල් | 40,000 | 28,732 | 71.83 | 35,849 | 27,131 | 75.68 |
| මෝටර්රථ | 70,000 | 76,435 | 109.19 | 71,906 | 55,517 | 77.21 |
| අනෙකුත් | 7,000 | 3,087 | 44.1 | 5,347 | 2,516 | 47.05 |
| ඇගලුම් සඳහා දේශීය විකුණුම් සඳහා ගාස්තු | 95 | 89 | 93.68 | 95 | 91 | 95.79 |
| **මුළු එකතුව** | **453,120** | **398,613** | **87.97** | **405,622** | **362,781** | **89.44** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේදී සංශෝධිත ඇස්තමේන්තුව අනුව අපේක්ෂිත බදු ආදායමේ තථ්‍ය කාර්යසාධනය සියයට 12.03 කින් අඩු වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය සියයට 10.56 කින් අඩු වී තිබුණි.

(ii) ආදායම් සංකේත 05 ක් සඳහා රු.මිලියන 50,000 ක් ඉක්මවා ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, එම අපේක්ෂිත ආදායම් ඉලක්කය මෝටර් රථ නිෂ්පාදන බදු ආදායම්වලින් පමණක් ඉටු කර තිබුණි. එහි කාර්යසාධනය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 109.19 ක් විය. අනෙක් ආදායම් සංකේත හතරෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොතිබුණි.

(iii) 2014 වර්ෂයේ සමස්ථ එකතු කළ අගය මත බදු ආදායම රු.237,915,432,907 ක් හා සමස්ථ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රු.44,583,121,716 ක් විය. එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සම්බන්ධව ආදායම් ගණන්දීමේ වගකීම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සතු වුවද, 2014 වර්ෂයේ රැස්කර තිබුණු එකතු කළ අගය මත බදු ආදායමෙන් සියයට 42.99 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු ආදායමෙන් සියයට 53.29 ක් ලෙස පිළිවෙලින් රු.102,281,490,518 ක් හා රු.23,761,586,645 ක ප්‍රමාණයන් ශ්‍රී ලංකා රේගුව විසින් එකතු කර තිබුණි.

## 3.12 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළයුතු ශේෂ**

ශ්‍රී ලංකා රේගුව විසින් 2015 මැයි මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|
| | මාස 6 කට වැඩි වර්ෂ 01 කට අඩු | වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු | වර්ෂ 03 කට වැඩි | |
| | රු. | රු. | රු. | |
| උපලබ්ධි නොවූ තැන්පතු | - | - | 4,166,667 | 4,166,667 |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 4,433,842 | 353,432 | - | 4,787,274 |
| හඳුනා නොගත් හර | 3,428,598 | 63,024 | 4,166,667 | 7,658,289 |
| හඳුනා නොගත් බැර | 1,052,972 | 253,058 | - | 1,306,029 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් බැංකු ජංගම ගිණුමක නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ රු.230,882 ක් වූ චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට එක් බැංකු ජංගම ගිණුමක බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු.76,261,274 ක් වුවත්, එය බැංකු සැසඳුම් ප්‍රකාශයේ රු.76,271,274 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) වසර තුනක් ඉක්මවූ උපලබ්ධි නොවූ එකතුව රු.4,166,667 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් නිවැරදි ගිණුම් පරිපාටි අනුගමනය කර නොතිබුණි.

(ඈ) එකතුව රු.5,806,850 ක් වූ හඳුනා නොගත් ගෙවීම් 2015 ඔක්තෝබර් 31 දින වන විටත් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) එකතුව රු.1,093,036 ක් වූ හඳුනා නොගත් ලැබීම් 2015 ඔක්තෝබර් 31 දින වන විටත් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් ලැයිස්තුවේ එකතුව රු.6,886,232 ක්වූ චෙක්පත් 25 කට අදාල චෙක්පත් අංක සඳහන් කර නොතිබුණි.

(උ) අනුක්‍රමික අංක අනුව චෙක්පත් නිකුත් විය යුතු අතර එසේ නිකුත් වන චෙක්පත් මුදල් පොතේ අනුක්‍රමිකව වාර්තා විය යුතු වුවත්, එසේ චෙක්පත් අංක පිළිවෙලට අනුක්‍රමිකව වාර්තා නොවූ අවස්ථා පැවතුණි.

(ඌ) මුදල් රෙගුලාසි 386(3) ප්‍රකාරව ලියනු ලබන සෑම චෙක්පතකම උප පත්‍රිකාවෙහි වවුචර් අංකය සඳහන් කර නොතිබුණි.

**3.13 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**----------------------------------**

ශ්‍රී ලංකා රේගුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

රේගු කෞතුකාගාරය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2013 මාර්තු 14 දින සිට දින 90 ක් තුළ එනම් 2013 මැයි 28 දිනට නිම කිරීමට එකඟවී තිබුණද, ගිවිසුම් කාලය තුළ වැඩ නිම කර නොමැති අතර වරින් වර අවස්ථා 7 ක දී කාලය දින 599 ක් දක්වා දීර්ඝ කර ගෙන තිබුණු අතර 2015 ජනවාරි 27 දින කොන්ත්‍රාත්තුව නිම කර තිබුණි.

**3.14 අවිධිමත් ගනුදෙනු**

**-----------------------**

ශ්‍රී ලංකා රේගුව විසින් එළැඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

ශ්‍රී ලංකා රේගුව විසින් ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගමට පවරන ලද ස්කෑන් යන්ත්‍ර සඳහා සේවා ගාස්තු ලෙස 2009 මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා රේගුව විසින් ගෙවන ලද රු.4,887,500 2014 දෙසැම්බර් 31 දින වන විටත් ගුවන්තොටුපල හා ගුවන් සේවා සමාගමෙන් අයකර ගෙන නොතිබුණි.

## 3.15 අනාර්ථික ගනුදෙනු

------------------------

ජංගම ස්කෑන් යන්ත්‍ර 03 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.17,503,409 ක් වැය කර තිබුණද එහි පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

## 3.16 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ එච්.එෆ්./1/4/CUS/115 - 27 දරන ලිපිය අනුව කාර්යසාධන ඇගයීම් පදනම් කරගෙන දිරිදීමනා ගෙවීම අනුමත කර තිබුණත්, එක් එක් නිලධාරියාගේ කාර්යසාධනය ඇගැයීම විධිමත් ඇගයීම් මණ්ඩලයක් මගින් සිදු කර නොතිබුණු අතර සියළුම නිලධාරීන්ට සියයට 100 ක කාර්යසාධනයක් සඳහා දිරි දීමනා ගෙවා තිබුණි. නිවාඩු සඳහා අඩු කිරීම් කිරීමේදී නිවාඩු නිවැරදිව ගණනය කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 751(1) ප්‍රකාර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතේ සටහන් කළ යුතු වුවත්, එසේ කර නොතිබූ අවස්ථා අනාවරණය විය.

## 3.17 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 340 | 284 | 56 |
| (ii) | තෘතියික මට්ටම | 1,152 | 720 | 432 |
| (iii) | ද්විතීයික මට්ටම | 970 | 659 | 311 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 488 | 324 | 164 |
| | **එකතුව** | **2950** | **1,987** | **963** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 963 ක් පිරවීමට ශ්‍රී ලංකා රේගුව කටයුතු කර නොතිබුණි.